# පේසී

## කාව්‍ය සංග්‍රහය







පේසී

පේසී වනසිංහ

# පේසී

## කාව්‍ය සංග්‍රහය

පේසී වනසිංහ

- **ජෙසී**
- **ජෙසී වනසිංහ**
- **978-624-208-861-1**

ජෙසී

# පිදුම

ගෙවූ දවසක් පාසා
නොතේරෙන කාලය හැර
සමාජය එකක් ගැටි ගැටී
විදපු, දැකපු, නා නා විධ වූ
අත්දැකීම් කැටිව
පෙළ ගසා
සහෘදයට රස විඳින්නට
පුද මම හරසරින්

## ගුරුවරුන් සඳහා

## පෙරවදන

ධරණීය මානව සංවර්ධන සංකල්ප රාමුව තුළ සංවර්ධනය සහ වෙනස්වීම්වලට ගැළපෙන දැනුම අවබෝධය සහ සරල බුද්ධිමය හැකියාවන්ගේ සිට විමර්නශීලි චින්තනය නිර්මාණාත්මක කුසලතා වලින් සමෝධානික වු ඉහළ බුද්ධිමය හැකියාවන් මෘදු කුසලතා පෙරදැරි වු භාවමය බුද්ධිමය හැකියාවන්ගෙන් පරිපූර්ණ වු සමබර පෞරුෂයක් සහිත අනාගත පරපුරක් බිහිකිරීමේ වගකීම අද වන විට ගුරුවරයා වෙත පැවරී තිබේ ඒ සදහා සමබර පෞරුෂයකින් හෙබි ගුරුවරයෙකු පාසලට අවශ්‍යය වෙයි ඔහු තුළ මෘදු ජීවන කුසලතා වැඩි දියුණුව පාසල් පාදක ගුරු සංවර්ධන ව්‍යාපෘති හරාහා සිදුකිරීම වඩත් ඵලදායි වෙයි

දැනට වසර ගණනාවක සිට අප පාසල් දියණියන් සහ ගුරුභවතුන් එක්ව ග්‍රන්ථ රචනා කරමින් රටේ පාසල් පද්ධතිය තුළ සාහිත්‍ය ප්‍රබෝධයක් මෙන් ම අධ්‍යාපනයේ ගුණාත්මක සංවර්ධනයක් ඇති කිරීමට මුල් වීම පාසලක් වශයෙන් අප ලබන ජයග්‍රහණයකි

මෙවර අප පාසලේ ආදි කතෘ කරඳන අත්ථදස්සී මාහිම්පානන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමුකරන "හෙරණ ගත්කරණී "ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය

මෙම ශාස්ත්‍රිය සහ ශාසනික ව්‍යාපෘතිය යටතේ පාසල් දරුවන්ට ආදර්ශයක් දෙමින් තම සාහිත්‍ය නිර්මාණාත්මක හැකියාවන් ප්‍රදර්ශනය කරමින් මෙවන් කෘතියක් රචනා කරන්නට ඉදිරිපත් විම ප්‍රශංෂනීය කරුණකි ගත්කතුවරයෙකු වීම තම ගුරු දිවියට නව අගය එකතු කිරීමක් බව මගෙ හැගීමයි

විදුහල්පතිනිය

ශශිකලා සේනාධීර

මහාමයා බාලිකා විද්‍යාලය - මහනුවර

# පසුවදන

රටක අනාගතය සඳහා මානව සම්පත සුදානම් කිරීමේ වගකීම පැවරී ඇත්තේ ගුරුවරයාටය එහෙයින් ඔහු කායික මානසික සහ සමාජීය වශයෙන් යහපත් සෞඛ්‍ය තත්වයකින් පසු වීම වැදගත්ය ඔවුන් සමාජයේ පෙරගමන් කරුවන් නිසා ශීඝ්‍රයෙන් වෙනස් වන ලෝකයේ දැනුමෙන් යාවත් කාලීන වීම ද දරුවන්ගේ පරමාදර්ශී චරිතයක් වීම ද අත්‍යවශ්‍ය වෙයි තමා වෙත පැවරෙන දරුවන්ගේ විභවතා හඳුනා ගනිමින් ඒවා ඔපවත් කිරීම ඔහුගේ සමාජ වගකීමයි

මෙම යථාර්ථ පසක් කොටගත් ගුරුවරයෙකු වශයෙන් මා පාසල් පද්ධතියේ සාහිත්‍ය නිර්මාණකරණය සහජ කුසලතාවය කොට ගත් දරුවන් දහස් ගණනක් දේශීය සාහිත්‍ය කෙතේ අනාගත ගත්කතු අංකුර ලෙසින් රෝපණය කරන්නක් විය ඊට සමගාමීව විදුහල්පතිවරුන් ගුරුභවතුන් මෙන්ම අධ්‍යාපන කේෂත්‍රයේ විවිධ වෘත්තිකයන්ට තම නිසඟ සාහිත්‍ය නිර්මාණ හැකියාවන් ප්‍රදර්ශනය කිරීමට ද වේදිකාවක් සකසාදීම ට ලැබීම භාග්‍යයකි මෙවර දෙස් විදෙස් පාසල් දරුවන් හා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂුන් වහන්සේලා සමග පොත් ලියන "හෙරණගත්කරණී "ව්‍යාපෘතිය යටතේ රචනා වන මෙම කෘතිය පාසල් පද්ධතියේ දරුවන්ට මෙන්ම ගුරුවරුනට ද ආදර්ශයකි ඔබගේ නිර්මාණ දිවිය සඵල වන්නට සුභ පැතුම්

හෙරණගත්කරණී නිර්මාතෘ

සෙනෙවිරත්න මහලේකම්

2025 02 08

# ගැහැණිය

වැලිකැට තුළ ලෝකටය දැක

සිනිඳු මලින් දෙව්ලොව යන

හෝරාවක් අත්ලේ උණුසුමින්

සදාකාලිකත්වය විඳ

අබ මිටක් සෙව් කිසාගෝතමිය

අවසානයට ඉතිරි විය..........

# ජීවන චක්‍රය

කාලය සියලල්ල වෙනස් කරද්දී

සමීපතයෝ දුරස් වෙද්දී

නෑදෑ හිතවතුන් ඈත් වෙද්දී

මහගෙදරට යාම හීනයක් වෙද්දී

අඳුරගෙන හිටපු හිතවත්තු ....

එකින් එකා මැරෙද්දී

සැහැල්ලුවෙන් ගෙවන්න හිටපු ජීවිත

පැටලිලා යද්දී....

මේ සියල්ල සාමානක්‍ය දෙයක් වී

චක්‍රය හරියටම තේරුම් ගනිද්දී

අපිට

# දරුවෙක් කතා කරයි

මට මාව අතැරුණද?

සමීපතයෝ මාව අත ඇරියද?

අම්මගේ උණුසුම ඕන වෙද්දී

මඟ ඇරී ගිය තැන

තාත්තා එක්ක දොඩමළු

වෙන්න ඕන උනත්

නැති වුණා තාත්තාට වෙලාවක්

ටීචර්ට වැඩ වැඩී

වෙලාවක් නැති වුණා

මගේ දුක අහන්න

මං වගේම මඟ හැරුණු

යාළුවෝ එක්ක හිටියේ මං අමාරුවෙන්

ඇති වගේ හිටියා මට

වෙහෙසයි දැනටමත්

යන්න බෑ තව දුරක්

රු.300 ටිකට් එකට

ලේසිම විදිහ තෝරගත්තා ....

නෙළුම් කුළුණ ....

# රට අනුරට

නුහුලන අපරාද

උහුලන්නෙ නැති විශ්වය

මහ පොළොව වෙනුවෙන්

නඩු අහන්න

සාධාරණ තීන්දුවකට

නව පුනරුදයේ මං සලකුණු

විවර උණා...

ඔන්න මෙන්න

රව අනුරට...

# අම්මා

ඇය වත් නොදැන සිටි

ලෝකයට නොගැටිච්ච

අහිංසක ගැහැනිය

ඇය වත් නොදැන සිටි

ඇගේ වට පරාසය

දරුවන්ටම කැප වී

ජීවිතය කැප කරන

රුයක් දවාලක් නොදැක

අපූරුවට තැනෙන ඒ

ඇගේ නිර්මාණය

වැසුණු දෙවොලකට වඩා

පසඟයටම සුදුසු

කිව නොහැක වෙන අර්ථයක්

ඈ ම විය අම්මා...

# පිං කත

හැර ගියත් තෙමසක් වී                    මාව

හොරු ගෙනිහින් වගේ පේනවා හැමදාම

උණුසුම දැනෙයි තනි වුණ හැම  විටකම

තුරුලේ නිදන්න එන්නකෝ හීනෙන් හැමදාම

මග බලන් හිටියා මං එනකං මඟටම වී

ආදරේ දාලා ඉව්වේ දවසම කුස්සියට වී

නින්ද නැතිව දොඩමළු වුණා රූ හිනාවෙවී

මං තනි වුණා නුඹ නැති වූ දා අහකට වී

වරදක් කරේ නෑ හොරෙහින්වත් කෙනෙකුට

ණයක් නොවී ගියෙ නුඹ හරි උජාරුවට

දනක් බණක් ඕනේ නෑ නුඹට

දන් පිං කරේ නුඹට මං ආදරේට

# බිරිඳගෙන්

ඉහටත් උඩින් ගිය

මිනිස්කම එක්ක

හැබෑම ලෙන්ගතුකමක්

මට වඩා මාව හැඳුණුව

හරිම ආදරණීය නුඹ

පිනකට ලැබුණ හැටි

අදහන්න බෑ තාම

ඇබ්බැහිවීම දිනෙන් දින

දහමක්ම වුණා නුඹ මට

# කර්මය ඵලදීම

නොරිදන්න හේතු ඇති විට

රෙදවීම ආදරයක් ද?

සතුට පෙනී පෙනී

දුක් විඳීම පුරුද්දක්ද?

අත් හැරීම දැන දැනම

බැඳීමත් වහල් වීමක්ද?

නුඹට නුඹ පෙනී පෙනී

නුඹව නොදැකීම

කර්මය ඵල දීමක්ද?

# පුංචි එකී

හීන දැක්කත් නුඹ

යන්න දොරකඩින් එහා

උඹේ කූඩුව හදන්නට

උඹේ සිහිනය දරා

උහුලන්න බෑ මට

දිගයක් ඕනමද උඹට

යවන්න ලෝභයි මට

අනේ කාලය නැවතියන්

දෝණි මා ළඟ තියාපන්

පුංචි එකීගේ සුරතල්

එක්ක බස් විඳින්නට

තව කාලයක් ඉන්න ඇරපන්

# පලයන්

නික්මෙන්න අහැකිද

කියපු පලියට

දුන්නේ ඇයි මට

මහ දේවල් උසට

ගත්තා මතකයි මට

හාර හාරා මට සිළුටුවට

දෙවියන් පල්ලා බෑ හැරෙන්නට

ආදරේ බැරෑරුම් බව

කියාදුන්නේ

නුඹ තක්කේටම

# පෝලිම

ඉමක් නොපෙනෙන දුරක

පාන්දර පෝලිමකට

තෙල් බවුසරේ එතකොටත්

නැව ළඟ

හොයල බලපු මගේ අපහසුකම්

මනුස්සකම් ඇති ත්‍රීරෝද මාමා

පන්ති පරතර නැති හමු වුන මිනිස්සු

දන්සලෙන් ප්ලේන්ටිය, බිස්කට්

පින් අයිති වෙන්න ඔවුන්ට...

පෙර මඟ බලන් ඉන්න

අහිංසක දරුවො දෙන්නා

මැදියම් රාත්‍රිය තෙක්ම

කාලකන්නි දවසක් ඇතුලේ

හිරුත් සඳුත් මා එක්ක

තනි රැක්ක...

දරා ගත නොහැකි කර්කශ

රළු රටාව

පාලකයින්ට හෙන ගහන

පොලිං සංස්කෘතිය...

# ජීවිතය

සුදු වෙච්ච කෙස් එක්ක

රැළි වැටිලා හම වැටිච්ච

සුදු ඇඳුම් වැඩි වෙච්ච

පන්සලකට ළං වෙච්ච

වෙන්න දඟලන නිවිච්ච

සව් ශක්තිය තුළ බැබලිච්ච

පාපතරයෙන් හිරවෙච්ච

හෙව්වවත් සුදු ඇදගෙන

හුරුවෙච්ච

ගැලවියන් පුළුවං නං

කර්මයෙන් බොඳ වෙච්ච...

# නික්මනක සටහන

මිනිස් කම් ඇති

සරල සුන්දර මිනිසුන් මැද

ගෙවූ සුන්දර කාලය

වසර ගණනක් බැඳි මතකය

හන්තාන සිසිලස මැද

ආදරණීය ඔබ සැම

මතකයේ රැදෙයි සදා..

# අලුත් කාලයේ ටීචර්

කොණ්ඩ ගුලිය බෙල්ලට තද නොකලාට
ඉනට උඩින් ඔසරිය නො ඇන්දාට
හැට්ට කර කපා පිට වැඩිපුර පෙනුනාට
ඉගැන්නුවේ දරුවෝ ටික ගොඩ දාන්නට

දරුවො එක්ක සෙල්ෆිය ගහල එෆ්බී දැම්මාට
ටික්ටොක් එකෙත් හිටියලු මං උජාරුවට
ලොකු සර් ගෙන්නුවා මාව ඔෆිස් එකට
කන පිරෙන්න දුන්නා මට නීතියට

යාව ජීව කාලයේ මං නොවුනාට
හිතට එකඟවම දෙනවා ශිල්පය මරුවට
දරුවො එක්ක ඉන්නට මට හැමදාම
තරුණ ජවය ලැබෙයිද මට හැමදාම

# අනිත්‍ය

ඝනව තිබූ කලු කොන්ඩෙ
අතරින් පතර සුදු වෙලා
අකුරු බොඳ වී පෙනී
උපැස් යුවලක් ගන්නම වුණා
පිරුණු පැහැපත් හමත්
අවර්ණව රැළි වෙලා
තරුණකම මතුවෙන්න
තදට තොල් සායම් උලාගත්තා
කර උසට තරුණ පුතු
මගේ රුව ගත් තරුණ දියණිය
දැක දැකම මං පරිණත වුණා
අනිත්‍ය සිහි කරත් මං
නිවන නං හරි දුරයි හිතුණා...

# සොඳුරු හුදකලාව

නොනවතින නොසන්සුම

ගැට ගැසුණු ජීවිත

කලබලයි හැම තැනම

මනසට හරි පීඩනය

වෙහෙසකර අත්දැකීම්

දවසින දවස හොඳ පාඩම්

සැනසුම හොයන මඟ

හමු වුණෝ

සොඳුරු හුදකලාව....

# ආස්සරය

කෙනෙකු කා බී ආස්සරය

කරනුයේ කවුද?

කාලය සමඟ යන ගමන

ආස්වාදය ලබන

අහු වෙන එවුං

ආස්සරය කරන ...

පරිස්සමට යැයි දැනෙන විට

විය යුතු දේ වී අවසානය

ලබන ඒ අත්දැකීම්

මට්ටුටක් නැත කිසි විටෙක

ඒ දේම සිදුවෙයි

ජීවිතය පුරාවට

ලබන ඒ ආස්සරය

හොඳ එවුන්ට ඒ අතර

# දික් කසාදය

පෝරුවට නග්ගගෙන
පොල් ගෙඩිය බිඳ
වස් දොස් දුරු කර
උපිරුවට මාව කැන්දන් ගොස්
දුන්නු හැම දේම ඉහටත් උඩින්
ගත්තු හැම දේම ඊටත් එහා
එක් නිමේෂයක් තුළ
මුහුණු පොතේ කෙල්ල
නුඹට ලොකු වුණෝ මන්ද
කූඩුවට නග්ගවා
දොස් පරොස් බොරු චෝදනා දී
දුන් ඒ දික්කසාදය...
පඩිය බැහැලා යන්න යද්දී
මුහුණ බැලුවා වරක් මා දෙස
දුකයි උඹ ගැන
කොතනින් නවතින්නද උඹ...